# ප්‍රධාන අමාත්‍යාංශය - දකුණු පළාත
# முதல் அமைச்சு - தென் மாகாணம்
# Chief Ministry - Southern Province

ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, ප්‍රවාහන, ජල සම්පාදන හා ජලාපවහන, විදුලිබල, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශය

முதலமைச்சர், சட்டமும், ஒழுங்கும், போக்குவரத்து, நீர் விநியோகமும், வடிகால் அமைப்பு, மின் சக்தி, சுகாதாரமும் தேசிய வைத்தியமும் மற்றும் உள்ளூராட்சி அமைச்சு.

Ministry of Chief Minister, Law and order, Transport, Water Supply & Drainage, Electricity, Health & Indigenous Medicine and Local Government.

15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල.
15 ஏ, கீழ் டிக்ஸன் பாதை, காலி.
15 A, Lower Dickson Road, Galle.


මගේ අංකය / My Ref. දපස/සෞ/පාසෞප්‍රවැ    ඔබේ අංකය / Your Ref.    දිනය / Date 2011.05.27

කළමනාකරු,

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

.......................................................................

**"දක්ෂිණ ජීවනී" දැනුම මිනුම තරගාවලිය සඳහා ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය කිරීම**

මෙි සමග අමුණා ඇති දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ මිළ ගණන් කැඳවීමට අදාළ දැන්වීමට අනුව "දක්ෂිණ ජීවනී" දැනුම මිනුම තරඟාවලියේ ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය සඳහා මිළ ගණන් කැඳවනු ලබන බව කාරුණිකව දන්වමි.

එම දැන්වීමෙ සඳහන් කොන්දේසි වලට යටත්ව නියමිත දිනට පෙර ඔබ විසින් මෙයට අදාළ මිළ ගණන් ඉදිරිපත් කරන්නේ නම් කෘතඥ වෙමි.

ඊ.යූ. වෙලාරත්න
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය

## දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය - "දක්ෂිණ ජීවනී දැනුම මිනුම තරගාවලිය" - 2011
## ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා මිළ ගණන් කැඳවීම

උක්ත පරීක්ෂණය 6,7,8 / 9,10,11 / 12,13 ශ්‍රේණි කාණ්ඩ තුන සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය වලින් ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු පත්‍ර මුද්‍රණය කර ශ්‍රේණි කාණ්ඩ අනුව පැකැට්ටු සකස් කර මුද්‍රා තබා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත භාරදීම සඳහා පහත සඳහන් කොන්දේසි යටතේ මිළ ගණන් කැඳවනු ලැබේ.

<u>ප්‍රශ්න පත්‍ර හා පිළිතුරු පත්‍ර මුද්‍රණය</u>

| ප්‍රශ්න පත්‍රයේ ප්‍රමාණය | ප්‍රශ්න පත්‍ර මුද්‍රණ ප්‍රමාණය අදාළ මිළ ගණන් (රු.) | | | | |
|---|---|---|---|---|---|
| | 50000 දක්වා | 100000 දක්වා | 200000 දක්වා | 250000 දක්වා | 300000 දක්වා |
| පිටු 4 - 8"×10"ප්‍රමාණයේ ප්‍රශ්න පත්‍ර | | | | | |
| පිටු 1 - 8"×10"ප්‍රමාණයේ පිළිතුරු පත්‍ර | | | | | |

<u>පැකට් කිරීම</u>

| කාණ්ඩය | පැකට් ගණන | | මිල ගණන් (රු.) | |
|---|---|---|---|---|
| | සිංහල | දෙමළ | ප්‍රශ්න පත්‍ර | පිළිතුරු පත්‍ර |
| 6,7,8 | 853 | 40 | | |
| 9,10,11 | 836 | 40 | | |
| 12,13 | 336 | 18 | | |

ප්‍රශ්න පත්‍ර පැහැදිලිව නිවැරදිව 8"×10" ප්‍රමාණයෙන් (A3 ප්‍රමාණයේ කොළය මැදින් දෙකට බෙදෙන පරිදි) මුද්‍රිත අකුරු වල ප්‍රමාණය 12 ද වන සේ මුද්‍රණය කිරීමට 60 GSM සහ ඩිමයි කඩදාසි යන වර්ග දෙකෙන්ම මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

එක් එක් ශ්‍රේණි කාණ්ඩවලට අදාළ ප්‍රශ්න පත්‍ර සහ වෙන්ව පැකට් කරන ලද පිළිතුරු පත්‍ර ද එකම කවරයක බහා, එක් එක් පාසලට අදාළ සියළුම කාණ්ඩවලට අයත් පැකට් පාසල් වශයෙන් වෙන් කර දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත භාරදිය යුතුය.

ඒ ඒ වර්ග කිරීම් යටතේ පැකට් කළ යුතු ප්‍රශ්ණ පත්‍ර සංඛ්‍යා ඇතුළත් උපලේඛණයක් සහ ප්‍රශ්න පත්‍ර පැකට් වල ඇලවිය යුතු ලේබල් මා විසින් ලබා දෙන බැවින් පැකට් කිරීම සඳහා මිල ගණන් සහ සමස්ත මිල ගණන් ද මේ යටතේ ඉදිරිපත් කළ යුතු බව සඳහන් කරමි.

ආදර්ශ කඩදාසි සාම්පල සමග සීල් කරන ලද මිළ ගණන් 2011.06.14 දිනට පෙර ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, පහළ ඩික්සන් පාර, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. ලිපිකවරයේ ඉහළ වම් කෙලවරේ "මිළ ගණන් කැඳවීම - දක්ෂිණ ජීවනී 2011" ලෙස සඳහන් කළ යුතුවේ.

ඒ.යු. වෙලාරත්න
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය